## 1.0 හැඳින්වීම (Introduction)

ජ්‍යොතිෂ යනු බැබලෙන වස්තුව යන වචනාර්ථය දෙන්නකි. බැබලේ යන අර්ථයෙන් තාරකාවන්ට ජ්‍යොතිෂ ලෙසට ව්‍යවහාර කරති. ඒ නිසා තාරකා පිළිබඳ ශාස්ත්‍රයට ජ්‍යොතිෂ, ජ්‍යොතිෂ ශාස්ත්‍රය කියා ව්‍යවහාර කරති. සිංහල ශබ්ද කෝෂයේ "ජ්‍යොතිෂ නම් බැබලීම, තරුව, තාරකාව, ගින්දර, අග්නිය, එළිය, ආලෝකය ඇසේ කළු ඉංගිරියාව, තාරා මණ්ඩලය, ගිනි දෙවියෝ" යනාදි නම් භාවිතා කර ඇත.

ජ්‍යොතිෂ යනු ආලෝකය හා බැබලීමයි. ඒ නිසා බබළන සුළු වස්තු ගැන මිනිස්සු සොයන්නට වූහ. බුදු දහමෙහි දැක්වෙන ලෝකය පිළිබඳ චින්තනයට අනුව සකලවිද විශ්වයේ වසන සත්ව ප්‍රජාවන් අතුරින් උසස්ම තැනක් හිමි වන්නේ මිනිසාටය. මිනිසා විසින් තමන්ගේ ධන ධාන්‍ය භව භෝග, ගව මහීෂාදී සම්පත්වලට පැමිණෙන්නා වූ උපද්‍රව සහ ලෙඩ රෝග වලින් මිදීමසඳහාත් යම් පුද්ගලයෙකු කෙරෙහි බලපා ඇති යම් යම් රෝගාබාධ සුව කර ගැනීම හා ගමට රටට ඇති වී තිබෙන්නා වූ ව්‍යසනයකින් මිදී සෙතක් හා ආරක්‍ෂාවක් කර ගැනීමේ අපේක්ෂාවෙන් යාග හෝම කිරීමට, නැකත් බැලීමට හුරු පුරුදු විය. සියළු පීඩාවලට අදෘශ්‍යමාන බලවේග තමන්ට පිහිට වන බව මිනිසා අසීමිත ලෙස විශ්වාස කළහ. ග්‍රහතාරකාවන්ගේ විකිරණ බලපෑම මත මනුෂ්‍යයාගේ හා වෘක්ෂලතාවන් ගේ පැවැත්ම සිදුවන බව මිනිසා තේරුම් ගෙන සිටියහ. මේ නිසා මොවුන් ග්‍රහතාරකාදීන්ගේ බලය පරීක්ෂා කිරීම සඳහා අතීතයේ සිට උත්සාහයක යෙදී ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ජ්‍යොතිෂ ශාස්ත්‍රය බිහිවිය. "ජ්‍යොතිෂ ශාස්ත්‍රය යනු චන්ද්‍ර සූර්යයා ප්‍රධාන ග්‍රහතාරකාදී වස්තූන්ගේ පිහිටීම මිනිස් ජීවිත කෙරෙහි බලපාන ආකාරය උගන්වන ශාස්ත්‍රයයි."

**(ගම්ලත්, එස්. කේ. 2001: 42)**

නක්‍ෂත්‍රය, හෝරා ශාස්ත්‍රය ලෝකයේ කවර කාලයක කිනම් පුද්ගලයකු විසින් සොයා ගත්තේ දැයි නිශ්චිත වශයෙන්ම පැවසීම අපහසුය. "ජ්‍යොතිෂ ශාස්ත්‍රය මෙන් ප්‍රත්‍යක්‍ෂ ශාස්ත්‍රයක් මේ ලෝකයෙහි වෙනත් නැත්තේය" එහෙයින් ජ්‍යොතිෂ ශාස්ත්‍රය චරාචර සකල ලෝ වැසියන්ගේ අතීත වර්තමාන අනාගත යන කාලත්‍රයවර්ති වූ සියල්ල දැනගැන්මෙහි සමර්ථ වූ දිව්‍ය ඇසක් හා සමාන වේ. පුරාතනයේ අහස් ගැබ නිරීක්‍ෂණය කර තාරකාවන් සහ ග්‍රහයින් ගේ ගමන් මග පිළිබඳව බැඳුණු ඒකාකාරී බව මෙන්ම ඒවා එකිනෙක අතර ඇති සම්බන්ධතාවයන් ද මිනිස්සු අවබෝධ කර ගත්හ.

ඒ නිසා නූතන විද්‍යාවන් සියල්ල භෞතිකවාදී දර්ශනයන් මත ගොඩ නැගී ඇති බවත්, ජ්‍යොතිෂ යනු න්‍යායන් ඉක්මවන ලද වෛද්‍යනික වශයෙන් වස්තූන්ගේ කාර්ය ක්ෂේත්‍රයන් මෙහෙයවනු ලබන ස්ථිර ස්වභාවයන් අනාවරණය කෙරෙන දර්ශනයක් මත පිහිටුවා ගොඩනැගුණු විද්‍යා මාර්ගයක් ද බව පෙන්වයි. එබැවින් ජ්‍යොතිෂ විද්‍යාවට අයත් දර්ශනයන් නූතන විද්‍යාවන්ට අදාළ දර්ශන න්‍යායන්ට වඩා පංචේන්ද්‍රියන් ගේ බලය ඉක්මවූ මනෝන්ද්‍රිය දියුණු කිරීම තුළින් පහළ කරගත යුතු න්‍යාය මාර්ගයක් බව පැහැදිලි කිරීම නූතන අවශ්‍යතාවයකි.

"සියලු සත්වයින් ග්‍රහ තරු වලට අයත් බව අවබෝධ වීමෙන් පසු මනුෂ්‍යාගේ යහපත හා අභිවෘද්ධිය පිණිස මේ ශාස්ත්‍රයේ පිහිට සොයා ඒ වෙත ඇදී යාමට මිනිසුන් පටන් ගෙන තිබේ."

(සිල්වා, ඩබ්ලිව්. එච්. ඩී 1986 : 22)

වර්තමානය වන විට මෙරට ජනමාධ්‍ය පද්ධතිය මගින් ජ්‍යොතිෂ ශාස්ත්‍රයටම අනන්‍ය වූ වැඩසටහන්, ලිපි තම මාධ්‍යයන් හරහා ග්‍රාහක, ප්‍රේක්ෂක, පාඨක ජනතාව, වෙත සම්ප්‍රේෂණය කරනු ලබයි. නූතනයේ සෑම රූපවාහිනී මාධ්‍ය ජාලයකින්ම, සෑම ගුවන්විදුලි මාධ්‍ය ජාලයකින්ම පාහේ මෙන්ම මුද්‍රිත මාධ්‍ය මගින් ද විවිධ ජ්‍යොතිෂ වැඩසටහන් විසුරුවා හරිනු ලබයි. ඒ සඳහා තම ගුවන් කාලයෙන් වැඩි ප්‍රමාණයක් වෙන් කර ඇත.

ලංකාවේ බොහෝ දෙනා ජ්‍යොතිෂයට ගරු කර නිසාත් ජ්‍යොතිෂ විශ්වාස කරන නිසාත් ජ්‍යොතිෂ මුවාවෙන් මුදල් උපයා ගැනීමට උත්සාහ කරන පිරිසක්, ජ්‍යොතිෂයෙන් කෙරෙන ශාස්ත්‍රීය සේවාව පසෙක තබා ජ්‍යොතිෂශාස්ත්‍රයේ මුවාවෙන් බොරුවක් හෝ විකුණා, මුදල් ඉපයීමේ ව්‍යායාමයක යෙදෙනු දක්නට ලැබේ. ඒ නිසා ජ්‍යොතිෂ්‍යශාස්ත්‍රය සේවාව කරන අය වෙනුවට ජ්‍යොතිෂ විකුණා කන බොහොමයක් දෙනා මේ රටේ දැකිය හැක. මෙම තත්ත්වයට විසඳුම් සෙවිය යුතුය.

වර්තමානයේ අපේ රටේ ජ්‍යොතිෂය සඳහා ප්‍රකාශයට පත්වන පුවත්පත් කීපයක් ඇති නමුත් ඒ සියලුම පුවත්පත් මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් විනා ජ්‍යොතිෂ ශාස්ත්‍රයේ අභිවෘද්ධිය තකා පල කරන ඒවාද? නැද්ද යන බව තහවුරු කරගත යුතු සාධකයක් බවට නූතනයේ පත්ව ඇත.

ග්‍රහ ගමන්වල ස්වභාවය පෘථිවියේ දේශගුණය ඒවායේ විපර්යාස සහ මිනිස් ජීවිතයේ වෙනස්වීම් අතර සම්බන්ධය මැනවින් වටහා ගත්හ. එසේම තාරකා චලනය අනුව කාල නිගමනය ද කළ හැකි විය. ආදි අහස් ගවේශකයන් විසින් කරන ලද අධ්‍යයන කටයුතු පෙරදිග වාසීන් හා නවීන විද්‍යාවේදීන් විසින් නිවැරදිව විග්‍රහ කරන ලදහ.

මෙම අහස් නිරීක්ෂකයෝ අහසෙහි සහ පෘථිවියෙහි බෙදීම සහ නිගමන ක්‍රම සියල්ල නිවැරදිව සකස් කර මිනිසාගේ ජීවන ප්‍රවෘත්තීන්හි සුභ අසුභ අවස්ථාවන් සමග ඒවායේ සම්බන්ධතාවන් පෙන්වන ආකාරය ද නිගමනය කළහ. මෙසේ ලබාගත් විස්තර අනුව සකස් කරන ලද හිරුගේ ගමනට සාපේක්ෂව හිරුට පසුබිම් වූ තාරකා වළල්ල අනුසාරයෙන් ජ්‍යොතිෂ ශාස්ත්‍රඥයෝ රජුන් රටවල් හා ජන්මීන් ගැන නිවැරදි අනාවැකි පළ කළහ. ආකාශ වස්තූනගේ ගමන් මඟ සහ පෘථිවි ජීවීන්ගේ කටයුතු අතර විශේෂ බැඳීමක් මෙන්ම ඒවා නිවැරදිව හඳුනා ගැනීමේ හැකියාවන් ද වටහා ගත්හ.

"අද්‍යතනයේ දියුණුවෙන් දියුණුවට පත්ව ඇති සියලුම නූතන විද්‍යාවන් භෞතික න්‍යායන්ට පමණක් සීමා වූ ක්ෂේත්‍රයන් නිසා ඒ විද්‍යාවන් මගින් විසඳිය හැකිව ඇත්තේ පංචේන්ද්‍රියන්ට ගෝචරවන්නා වූ වස්තූන්ගේ ස්වභාවයට අයත් ගැටලු පමණක්ම වේ. මොනම ආකාරයකින්වත් අතීතය හෝ අනාගතය වශයෙන් ඒවා පිළිබඳ ගැටලු නිරාකරණය කළ නොහැකි බව ද පිළිගත යුතු කරුණකි. ඒ අනුව සලකන විට නූතන විද්‍යාවත් ජ්‍යොතිෂ විද්‍යාවත් අතර විශේෂ පරතරයක් ඇති බව පෙනේ."

(ජයසූරිය, ඩී. කේ. 1996 : 62)

ඒ නිසාම මෙම පරතරයට ඉවහල් වන්නා වූ හේතූන් පිළිබඳව පළමුවෙන්ම වටහා ගැනීම අවශ්‍යය. එය මිනිසාගේ විශ්වාසයන්ට බලපාන ආකාරය හඳුනා ගත යුතුය. මිනිසා එය විශ්වාස කරන්නේ ඇයි ද, තමාගේ දෛනික ජීවිතයේ කාර්යයන්ට ජ්‍යොතිෂ අදාළ කර ගන්නේ ඇයි ද? එසේ වීමට හේතු කවරේද? යන්න අධ්‍යයනය කළ යුතුය.

වස්තූන්ගේ භෞතික ලක්ෂණ පමණක් සලකා බැලීමෙන් ඒවායේ කාර්ය ස්වභාවයන් තේරුම් ගැනීමේ ක්ෂේත්‍රයට පමණක් නූතන විද්‍යාවන් සීමා වී ඇති බව පෙනේ. ජ්‍යොතිෂ ශාස්ත්‍රය එසේ නොව පංචේන්ද්‍රියන් ගේ කාර්ය ස්වභාවය ඉක්මවූ මනෝන්ද්‍රිය දියුණු කිරීම තුළින් වස්තූන්ගේ භෞතික හේතූන් මෙන්ම වෛද්‍යානික හේතූන් ද මැනවින් පිරික්සීමෙන් කාර්ය ස්වභාවය තේරුම් කළ හැකිය.